00115

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 5 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU5256 - ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම්**
කාලය - පැය දෙකයි. (02)

දිනය - 2023.01.28 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**I වන කොටස**

01. යටත් විජිත යුගයට පෙර පුරාණ ශ්‍රී ලංකාවේ ළමා අයිතීන් සම්බන්ධව පැවැති තත්ත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමයාගේ "උපරිම යහපත පිළිබඳ මූලධර්මය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

03. වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය නංවාලීමට රාජ්‍ය නොවන සංවිධානවලට උදව් වියහැකි ආකාර පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. ප්‍රාථමික පාසල් සිසුන්ගේ ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා ප්‍රාථමික ගුරුවරයාට දැරිය හැකි වගකීම් පහක් (05) ලියන්න.

05. ළමයින් සම්බන්ධව වර්ධනය හා සංවර්ධන අයිතිය සුරැකීමට දෙමාපියන්ට ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. "විශේෂ තත්ත්වයේ පසුවන ළමයින්" යනු කවුරුන් ද?

07. "ළමයින් සතු එක් අයිතිවාසිකමක් නම් සහභාගිත්වයට ඇති අයිතියයි." මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ළමා අයිතිවාසිකම් පිළිබඳ ව ඵලදායී සන්නිවේදනය කෙරෙහි බාධාකාරී ලෙස බලපාන සාධක තුනක් (03) දක්වන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. (i) ළමා අයිතිවාසිකම් යන්න නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) ළමා අයිතිවාසිකම් සම්මුතිය යනු කුමක් ද? (ලකුණු 07)

(iii) ළමා අයිතිවාසිකම් පිළිබඳව එම සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) 'දරුකමට හදා ගැනීම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) දරුකමට හදාගැනීමේ ආඥා පනතේ ඇති සුවිශේෂී කරුණු හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාව තුළ දරුකමට හදා ගැනීමේ ආඥා පනතේ ඇති කරුණු උල්ලංඝනය වන අවස්ථා මොනවාදැයි විභාග කරන්න. (ලකුණු 10)

11. (i) 'සුරක්ෂණය සඳහා අයිතිය' යනු කුමක් ද? (ලකුණු 02)

(ii) නිවෙස් පරිසරය තුළ බහුල වශයෙන් සිදුවන ප්‍රාථමික විය ළමයින්ගේ සුරක්ෂණය සඳහා අයිතිය කඩවන අවස්ථා තුනක් **(03)** නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ අවස්ථාවන් අවම කර ගැනීමට දෙමාපියන්ට ගත හැකි පියවර තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) 'ළමා අපයෝජනය' යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ලිංගික අපයෝජනයෙන් ප්‍රාථමික පාසල් ළමයින් ආරක්ෂා කර ගැනීමට ගුරුවරුන්ට යොදාගත හැකි උපායමාර්ග හතරක් **(04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 08)

(iii) එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) ළමා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට ශ්‍රී ලංකා රජයයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් **(04)** කෙටියෙන් දක්වන්න. (ලකුණු 04)

(ii) ඉහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා රජය මුහුණ දෙන ගැටලු හතරක් **(04)** කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ ගැටලු මඟහරවා ගැනීමට යෝජනා හතරක් **(04)** ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.